# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

**සමාජීය විද්‍යා පීඨය**

**භූගෝලවිද්‍යාව (නව නිර්දේශය)**

**ශ්‍රී ලංකාවේ භූගෝලවිද්‍යාව GEOG - E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නිවර්තන කලාපීය රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ භූගෝලීය පරිසරයෙහි පවත්නා විශේෂත්ව සහ මානව කටයුතුවල ප්‍රාදේශීය විවිධත්ව අතර පවතින සබඳතා පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 20)

02. ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනයේ නිර්මාණය පැහැදිලි කිරීමට ඉදිරිපත් වී ඇති මතවාද ඇසුරෙන් මෙරට සංකීර්ණ භූ ලක්ෂණ කොතෙක්දුරට පැහැදිලි කල හැකිදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 20)

03. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේ දී මෙරට දේශගුණයේ කාලීන සහ අවකාශීය රටා පිළිබඳව අවධානය යොමුකිරීමේ අත්‍යවශ්‍යතාව උදාහරණ ඇසුරෙන් අවධාරණය කරන්න. (ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන අභියෝග ජය ගැනීමේ දී විශේෂයෙන් අවධානයට ලක්කළ යුතු භූගෝලීය කරුණු උදාහරණ මගින් අවධාරණය කරන්න. (ලකුණු 20)

05. ශ්‍රී ලංකාවේ වර්තමාන භූමි පරිහරණ රටාව තීරණය වීම කෙරෙහි බලපාන ලද පසුබිම් සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. ශ්‍රී ලංකාවේ මන්දගාමී නාගරීකරණය ආශ්‍රිත පවතින පසුබිම් සාධක හා ක්‍රියාවලිය පිළිබඳ භූගෝලවිද්‍යාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. මෙරට මානව-පරිසර සබඳතා බිඳවැටීම හේතුවෙන් වර්ධනය වන පාරිසරික ආපදා හඳුන්වා දී ඒවායේ බලපෑම අවම කරගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතරින් <u>දෙකක් (02)</u> පිළිබඳව භූගෝලවිද්‍යාත්මක විග්‍රහයන් ඉදිරිපත් කරන්න.

    i. ශ්‍රී ලංකාව වෘක්ෂලතා විවිධත්වය
    ii. ශ්‍රී ලංකාවේ වෙරළ ඛාදනය සහ සංරක්ෂණය
    iii. ශ්‍රී ලංකාවේ භූ දේශපාලන වැදගත්කම
    iv. මහවැලි සංවර්ධන ව්‍යාපාරය

(ලකුණු 10 x 2 = 20)

**********************************